# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 689 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 22/04/2024<br>පැය 1300 |

## මාධ්‍ය නිවේදනය

### 01. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - බණ්ඩාරගම පොලිස් වසම.

2024.04.21 වන දින උදෑසන කාලයේ බණ්ඩාරගම පොලිස් වසමේ ගැලනිගම අධිවේගී මාර්ග පාලම අසල පුද්ගලයෙකු කාණුවක වැටී මියගොස් ඇති බවට බණ්ඩාරගම පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත. උස අඩි 05යි අඟල් 04ක් පමණ වන පැසුනු කොණ්ඩය අඟලක් පමණ වැවී ඇත. තලෙළු සිරුරකි. උඩු කයට නිල්පාට අත්කොට කමිසයක් හා යටි කයට තැඹිලි දුඹුරුපාට මිශ්‍ර සරමක් හැඳ සිට ඇත.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරික්ෂණය සඳහා බණ්ඩාරගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බණ්ඩාරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

### 02. මාරක රිය අනතුරක් - පැල්මඩුල්ල පොලිස් වසම.

2024.04.21 වන දින රාත්‍රී කාලයේදී පැල්මඩුල්ල පොලිස් වසමේ කොළඹ මඩකලපුව මාර්ගයේ පාතකඩ හන්දිය අසලදී පැල්මඩුල්ල දෙස සිට රත්නපුරය දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගය හරහා ගමන් කල පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා පැල්මඩුල්ල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත .

**මරණකරු වයස අවුරුදු 64 ක් වූ පාතකඩ, පැල්මඩුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා කහවත්ත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ යතුරුපැදියේ පැදිකරු අත්අඩංගුවට ගෙන ඇති අතර පැල්මඩුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - නෙළුක්කුලම පොලිස් වසම.

2024.04.21 වන දින උදෑසන කාලයේදී නෙළුක්කුලම පොලිස් වසමේ වව්නියාව මන්නාරම මාර්ගයේ පට්ටානිච්චූර් ප්‍රදේශයේදී මන්නාරම දෙස සිට වව්නියාව දෙසට ධාවනය වූ වෑන් රථයක් රියදුරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයේ දකුණු පසට වන්නට ධාවනය වීමේදී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක හා ත්‍රීරෝද රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ ත්‍රීරෝද රථ රියදුරු, යතුරුපැදිකරු හා පසුපැදිකරු වව්නියාව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු යතුරුපැදිකරු හා පසුපැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර රෝහලට ඇතුලත් කිරීමේදී පැදිකරු මියගොස් ඇත .

**මරණකරු වයස අවුරුදු 45 ක් වූ නෙළුක්කුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අනුරාධපුරය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට අදාල වෑන් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. නෙළුක්කුලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**